අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 | +94112785818
info@moe.gov.lk | www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/02/29/02/02/38

ඔබේ යොමුව / உமது இல. / Your Ref.

දිනය / திகதி / Date 2025.10. 01

**චක්‍රලේඛ අංකය: 07/2019 (i)**

**සියලුම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරුන්**
**සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,**
**සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,**
**සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,**
**සියලුම විදුහල්පතිවරුන්,**

**ගුරුපත්වීම් විෂයය වෙනස් කිරීම**

උක්ත කරුණට අදාළව නිකුත් කරන ලද 2019.02.25 දිනැති චක්‍රලේඛ අංක 07/2019 ට වැඩිමනත් වශයෙනි.

02. එම චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව ගුරුභවතුන්ගේ පත්වීම් ලිපියේ සඳහන් වෙනස් කිරීමක් සිදු නොකරන බවට සඳහන් වන නමුත් ගුරුවරුන් බඳවා ගැනීමේ දී නිකුත් කරනු ලබන පත්වීම් ලිපියෙහි පත්වීම් විෂය සහ පත්වීම් මාධ්‍යය සඳහන් නොවීම සහ පත්වීම් විෂයට පරිබාහිර විෂයයන් මේ වන විට ඉගැන්වීම මත දැනට පාසල් පද්ධතියේ සිටින ගුරු කාර්ය මණ්ඩල, විෂයයන් අනුව ඌණතා / අතිරික්තතා ගණනය කිරීමේ දී හා ගුරුවරුන්ගේ ස්ථාන මාරු කිරීමේ දී ගැටලු පැන නැගී ඇති බව නිරීක්ෂණය විය.

03. එබැවින් මේ සම්බන්ධයෙන් කමිටුවක් මඟින් අධ්‍යයනය කිරීමෙන් අනතුරුව එහි නිර්දේශ පරිදි උක්ත ගැටලුවලට විසඳුමක් ලෙස මෙම චක්‍රලේඛයේ පහතින් දක්වා ඇති ක්‍රියාපටිපාටිය අනුව කටයුතු කරන ලෙස දන්වමි.

04. ඒ අනුව, මෙහි 05 වන ඡේදයේ දක්වා ඇති පත්වීම් කාණ්ඩ සඳහා අදාළ අවශ්‍යතා සපුරාලන්නේ නම් පමණක් මෙම අවස්ථාවට පමණක් සීමා වන පරිදි 06 වන ඡේදයේ දැක්වෙන නියමයන් හා කාලරාමුව අනුගමනය කරමින් ඔවුන්ගේ පත්වීම් විෂය/ පත්වීම් මාධ්‍යය නිශ්චිතව ලබා දීමට හෝ දැනට නියමිත පත්වීම් විෂය / පත්වීම් මාධ්‍යය සංශෝධනය කිරීමට කටයුතු කළ යුතු අතර එය මෙම අවස්ථාවට පමණක් සිදුකරන බැවින් තවදුරටත් ඉහත ඡේදයේ අධ්‍යාපන චක්‍රලේඛ 07/2019 හි සඳහන් කොන්දේසි ඉදිරියට ද වලංගුව පවතිනු ඇත.

## 05. පත්වීම් විෂය තීරණය කිරීම සඳහා සලකා බැලිය යුතු සුදුසුකම් / නිර්ණායක

<table>
<tr><th>කාණ්ඩ අංකය</th><th>කාණ්ඩය</th><th>පත්වීම් විෂය නිර්ණය කිරීමට / සංශෝධනය කිරීමට සම්පූර්ණ කල යුතු අවශ්‍යතා</th></tr>
<tr><td>I</td><td>පත්වීම් ලිපියේ පත්වීම් විෂය සඳහන් නොවන ගුරුවරු</td><td rowspan="5">පහත i සහ ii යටතේ සඳහන් එක් ආකාරයකින් පමණක් සුදුසුකම් සපුරා තිබීම සලකා බැලිය යුතුය.<br><br>i. අදාළ විෂය අඛණ්ඩ පූර්වාසන්න වසර 5 ක් හෝ ඊට වඩා වැඩි කාලයක් ප්‍රධාන විෂය ලෙස උගන්වා තිබීම.<br>සහ<br>එම විෂය සඳහා ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 13.9 හි අර්ථ නිරූපණය කර ඇති අදාළ විෂය සඳහා වූ ගුරු පුහුණු පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම<br>හෝ<br>එම විෂය ප්‍රධාන විෂයක් ලෙස ඇතුලත් ශ්‍රී ලංකාවේ ගුරු සේවා ව්‍යවස්ථාවේ 13.7 හි අර්ථ නිරූපණය කර ඇති උපාධියක් සම්පූර්ණ කර තිබීම<br>හෝ<br>එම විෂය ප්‍රධාන විෂයක් ලෙස ඇතුලත් වන හෝ එම ප්‍රධාන විෂයට අදාළව ප්‍රායෝගික ඉගැන්වීම් පුහුණුව ඇතුලත් වූ ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාවේ 13.14 හි අර්ථ නිරූපණය කර ඇති පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාවක් සම්පූර්ණ කර තිබීම<br><br>ii. අඛණ්ඩව පූර්වාසන්න වසර 10 හෝ ඊට වැඩි සේවා කාලයක් ප්‍රධාන විෂය ලෙස උගන්වා තිබීම<br>සහ<br>එම විෂයට අදාළව පැය 150 කට නොඅඩු පුහුණු වැඩසටහනකට සහභාගී වී තිබීම.<br>හෝ<br>පූර්වාසන්න වසර 5 ක් හෝ ඊට වැඩි කාලයක් තුළ ප්‍රශ්න පත්‍ර පරීක්ෂකවරයෙකු ලෙස කටයුතු කර තිබීම</td></tr>
<tr><td>II</td><td>පත්වීම් ලිපියේ පත්වීම් විෂය ධාරාව පමණක් (උදා: කලා උපාධි, විද්‍යා/ගණිත උපාධි ආදී) සඳහන් වන ගුරුවරු</td></tr>
<tr><td>III</td><td>පත්වීම් ලිපියේ පත්වීම් විෂය සඳහන් වන නමුත් දැනට පාසල් විෂය නිර්දේශයට ඇතුලත් පත්වීම් විෂය නාමයන්ට වඩා වෙනස් වීම</td></tr>
<tr><td>IV</td><td>පත්වීම් ලිපියේ පත්වීම් විෂය සඳහන් වන නමුත් එම පත්වීම් විෂයන් කාලීනව පාසල් විෂය නිර්දේශය තුළින් ඉවත් වීම</td></tr>
<tr><td>V</td><td>පත්වීම් විෂය සඳහන් වන නමුත් ප්‍රධාන ඉගැන්නුම් විෂය ලෙස ඊට පරිබාහිර විෂයක් ඉගැන්වීම් කාර්යයේ නියුතු ගුරුවරු</td></tr>
<tr><td>VI</td><td>පත්වීම් විෂය සඳහන් වුවද පත්වීම් මාධ්‍ය සඳහන් නොවීම</td><td>අදාළ බඳවා ගැනීම් ගැසට් නිවේදන මඟින් හෝ බඳවා ගැනීම් සිදු කරන ලද බලධාරීන් මඟින් තහවුරු කර ගත හැකි නම් ඒ අනුව තීරණය කිරීමත් හෝ එසේ තහවුරු කර ගැනීමට නොහැකි නම් සලකා බලන දිනය දක්වා අදාළ විෂය උගන්වා ඇති මාධ්‍ය හෝ මාධ්‍ය වෙනස් වී ඇත්නම් අවම වශයෙන් පූර්වාසන්න වසර 05 ක් උගන්වා ඇති මාධ්‍ය පත්වීම් මාධ්‍ය ලෙස තීරණය කිරීම</td></tr>
<tr><td>VII</td><td>පත්වීම් විෂයට අදාළ පත්වීම් මාධ්‍ය සිංහල හෝ දෙමළ ලෙස සඳහන් වූ හෝ තහවුරු කර ගත හැකි වූ නමුත් පසුකාලීනව පාසල් හෝ රජයේ අවශ්‍යතාවය මත ඉංග්‍රීසි/ ද්විභාෂා මාධ්‍යයෙන් ඉගැන්වීම් කර ඇති ගුරුවරුන්</td><td>පත්වීම සිංහල හෝ දෙමළ මාධ්‍ය වුව ද පසුකාලීනව පද්ධතියේ / රජයේ අවශ්‍යතාවය මත අඛණ්ඩව පූර්වාසන්නයෙන් වසර 05 ක් ඉංග්‍රීසි/ ද්විභාෂා මාධ්‍යයෙන් ඉගැන්වීම් සිදු කර ඇත්නම් පත්වීම් මාධ්‍ය ඉදිරියට ඉංග්‍රීසි ලෙස තීරණය කිරීම (නමුත් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 29/98 යටතේ ඉංග්‍රීසි භාෂාව සඳහා භාෂා දීමනාව ලබා ගැනීමට එය බාධාවක් කර නොගත යුතු වේ.)</td></tr>
</table>

සටහන : ඉහත වගුවේ සඳහන් අවශ්‍යතා සඳහා ඉගැන්වීමේ නියුතුව ඇති ප්‍රධාන විෂය යනු ගුරුවරයෙක් යම් වර්ෂයකට අදාළ කාලසටහනෙ හි ඇතුලත් කාලපරිච්ඡේද ප්‍රමාණයෙන් 50% කට වැඩි ප්‍රමාණයකට අදාළව ඉගැන්නුම් කටයුතු කරනු ලබන විෂය ලෙස සැලකිය යුතුය.

## 6. පත්වීම් විෂය සංශෝධන ඉල්ලීම් සලකා බැලීමේ ක්‍රියාපටිපාටිය හා කාලරාමුව

6.1. 13 වසරක සහතික කරන ලද අධ්‍යාපන වැඩසටහන යටතේ වෘත්තීය විෂය ධාරාවේ විෂයයන් සඳහා උපාධිධාරීන් බඳවා ගැනීම යටතේ බඳවා ගත් ගුරුවරුන්, විදේශ භාෂා, විශේෂ අධ්‍යාපනය හා ශිෂ්‍ය උපදේශනය යන විෂයයන් හැර 2024.01.01 දිනට පෙර අනෙකුත් විෂයයන් සඳහා පත්වීම් ලබා ගත් ගුරුවරුන් සඳහා පමණක් මෙම චක්‍රලේඛ විධිවිධාන යටතේ පත්වීම් විෂය තීරණය කිරීම / සංශෝධනය කිරීම කළ යුතු වේ. කෙසේ නමුත් ඉහත 5 හි සඳහන් පරිදි වසර 10 ක් හෝ ඊට වැඩි කාලයක් සේවා පළපුරුද්ද මත පත්වීම් විෂය සංශෝධනය කිරීම සඳහා ඉල්ලුම් කරන ඉහත සඳහන් විෂයන් යටතේ වන ගුරුවරුන් ද සලකා බැලීම කළ යුතුය.

6.2. මෙලෙස පත්වීම් විෂය සංශෝධනය කිරීම පිළිබඳව තීරණ ගැනීම අදාළ ගුරුභවතුන්ගේ සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව විධිමත් පරිදි හා ඉතා සුපරීක්ෂාකාරීව සිදුකල යුතු වේ. පළාත් ගුරුවරුන්ගේ පත්වීම් විෂය සංශෝධනය කිරීම අදාළ පළාත් පත්වීම් බලධාරීන් වෙත යොමු කළ යුතු අතර ජාතික පාසල් ගුරුවරුන්ගේ පත්වීම් විෂය සංශෝධනය කිරීමට අදාළව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශ සහිතව අධ්‍යාපන ලේකම්ගේ අනුමැතියට යොමු කළ යුතු වේ.

6.3. ඉහත 5 ඡේදය යටතේ සඳහන් සියලුම කාණ්ඩ වලට අයත් වන ගුරුවරුන් විසින් මෙහි උපලේඛන 1 හි සඳහන් ආකෘතියෙන් තම පත්වීම් විෂය තීරණය කිරීමට / සංශෝධනය කිරීම සඳහා වන ඉල්ලීම විදුහල්පති හා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ මඟින් යොමු කළ යුතු වේ.

6.4. එසේම එම ආකෘතීන් හි තහවුරු කළ හැකි තොරතුරු විදුහල්පති විසින් තහවුරු කර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත යොමු කිරීමෙන් පසුව කලාප අධ්‍යාපන කාර්යාලයේ නඩත්තු වන පෞද්ගලික ලිපි ගොනුව අනුව විදුහල්පති විසින් අනුමත කළ කාලසටහන් සහ කාර්ය සාධන වාර්තා සහ අධ්‍යාපනික/ වෘත්තීය සුදුසුකම්, පිළිබඳ තොරතුරු ද තහවුරු කර ගෙන එම සපයා ඇති පෞද්ගලික හා සේවා විස්තර තහවුරු කර, අදාළ විෂයභාර නියෝජ්‍ය/ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ගේ හා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශය සහිතව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත යොමු කළ යුතු වේ.

6.5. ඉන්පසු පළාත් පාසල් හා ජාතික පාසල් යන දෙවර්ගයේම ගුරුවරුන්ගේ එම ඉල්ලීම් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ මූලිකත්වයෙන් ඔහු විසින් පහත 6.7 හි සඳහන් සංයුතියෙන් හෝ ඊට සමරූපී වන සුදුසු නිලධාරීන්ගෙන් සමන්විත වන පරිදි සකස් කරගනු ලැබූ කමිටුවක් හරහා

පරීක්ෂාකර එම එක් එක් ඉල්ලීම් සඳහා වන කමිටු නිර්දේශ අධ්‍යාපන සහතික, කාලසටහන් ආදී අදාළ කර ගනු ලබන ලේඛන ද සමඟ ඉහත 6.2 හි සඳහන් පරිදි නියමිත පත්වීම් බලධාරීන් වෙත යොමු කළ යුතු වේ.

6.6. එසේම යම් ගුරුවරයෙක් විසින් සම්පූර්ණ කර ඇති සුදුසුකම්වල අදාළත්වය තීරණය කිරීම සඳහා අවශ්‍ය විටෙක විෂයට අදාළ විශේෂඥ දැනුම ඇති හෝ කමිටුව විසින් තීරණය කරනු ලබන කමිටුවෙන් පරිබාහිර වෙනත් නිලධාරියෙකුගේ/ වෘත්තිකයෙකුගේ මතය හෝ නිර්දේශය විමසා බලා තීරණය කිරීමට ද හැකියාව ඇත.

6.7. කමිටු සංයුතිය :

- I. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ
- II. සංවර්ධන විෂයභාර අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ
- III. ගුරු ආයතන / පාසල් පරිපාලන විෂයභාර අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ
- IV. අදාළ විෂයභාර නියෝජ්‍ය / සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ

6.8. යම් ගුරුභවතෙකුගේ මුල් පත්වීම් ලිපියට අදාළ වන පත්වීම් බලධාරියා දැනට සේවා කරනු ලබන සේවා ස්ථානය අනුව වෙනස් වී ඇත්නම් (අන්තර් පළාත් ස්ථාන මාරුවීම් මඟින් හෝ මධ්‍යම රජයට අන්තර්ග්‍රහණය වීම ආදී හේතු මත) වර්තමාන සේවා ස්ථානයට අනුව අදාළ වන පත්වීම් බලධාරියා විසින් මෙම පත්වීම් විෂය සංශෝධනය අනුමත කිරීම කල යුතු වේ.

6.9. ඒ අනුව, පත්වීම් විෂය තීරණය කිරීම / සංශෝධනය කිරීමට අදාළ අවසන් තීරණය, පළාත් පාසල් ගුරුවරුන්ගේ නම් අදාළ පළාත් රාජ්‍ය සේවයේ පත්වීම් බලධාරියා (පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ පළාත් අධ්‍යාපන ලේකම්) විසින් ද ජාතික පාසල් ගුරුවරුන්ගේ නම් පත්වීම් බලධාරියා වන අධ්‍යාපන ලේකම් විසින් ද ගත යුතු වේ. එම පත්වීම් විෂය තීරණය කිරීම /සංශෝධනය කිරීම මෙහි උපලේඛන II /උපලේඛන III හි ඇතුලත් ආකෘතියෙන් අදාළ ගුරුවරයා වෙත නිකුත් කිරීමද එම පත්වීම් බලධාරීන් විසින්ම කල යුතු වේ.

6.10. කාල රාමුව

| අනු අංකය | ක්‍රියාකාරකම | කාල සීමාව |
|---|---|---|
| 01. | අයදුම්පත් කැඳවීම | ඔක්.01 - ඔක්.22 |
| 02. | අයදුම්පත් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ හරහා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත යොමු කිරීම | ඔක්.23 - නොවැ.14 |

| | | |
|---|---|---|
| 03. | පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් කමිටුව හරහා නිර්දේශ සකස් කර පත්වීම් බලධාරීන් වෙත යොමු කිරීම | නොවැ.17 - දෙසැ.08 |
| 04. | පත්වීම් බලධාරීන් විසින් අදාළ අනුමැතීන් කර පත්වීම් විෂය සංශෝධන/තීරණය කිරීමේ ලිපිය නිකුත් කිරීම | දෙසැ.09 - දෙසැ. 31 |

7. ඉදිරියේදී සිදු කරන ගුරු බඳවා ගැනීම් වලදී නිශ්චිතව පත්වීම් විෂය තීරණය කිරීම හා ඉදිරියේ දී පත්වීම් විෂයට අදාළ කාලසටහන් ලබා දීම

7.1. ගුරු සේවයට බඳවා ගැනීමට අදාළ අයදුම්පත් කැඳවීමේ නිවේදනය අනුව පත්වීම්ලාභියා පත්වීම් ලැබීමට සුදුසුකම් ලැබූ ඉගැන්වීම් විෂය ඔහුගේ/ ඇයගේ පත්වීම් විෂය ලෙස සැලකිය යුතු අතර අනිවාර්යයෙන්ම විධිමත් පත්වීම් ලිපියෙහි එම පත්වීම් විෂය සඳහන් කිරීමට අදාළ පත්වීම් බලධාරීන් විසින් කටයුතු කල යුතු වේ. එහිදී අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති දැනට බලාත්මක අධ්‍යාපන චක්‍රලේඛ 06/2021 හා ඊට අනුශාංගිකව නිකුත් කර ඇති චක්‍රලේඛවලට අනුකූල වන පරිදි පත්වීම් විෂයන් හි නාමයන් නිවැරදිව භාවිතා කිරීමට ද වග බලා ගත යුතු වේ.

7.2. එසේම ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාවේ "අ" පරිශිෂ්ඨයේ 2(ii) වගන්තියේ ප්‍රතිපාදන අනුව හෝ බඳවා ගැනීමේ නිවේදනයේ සඳහන් කර ඇත්නම් එම විධිවිධාන අනුව හෝ පළාත් පත්වීම් බලධාරීන් විසින් අනුගමනය කරන වෙනත් ක්‍රමවේදයක් අනුව හෝ අදාළ ගුරුපත්වීම්ලාභීන්ගේ පත්වීම් මාධ්‍යද තීරණය කර එය ද පත්වීම් විෂය සමඟ සඳහන් කිරීම අනිවාර්යයෙන්ම සිදු කල යුතු වේ. එසේ පත්වීම් ලිපියේ සඳහන් කල නොහැකි අවස්ථාවක් වේ නම් (උදා:- විදේශ භාෂා විෂයන්) වෙනත් ලිපියක් මඟින් හෝ අදාළ ගුරුභවතුන්ගේ පෞද්ගලික ලිපි ගොනුවට එම පත්වීම් මාධ්‍ය පිළිබඳ තොරතුරු ඇතුලත් කිරීමට පියවර ගත යුතු වේ.

7.3. යම් ගුරුභවතෙකු යම් පාසලක සේවය සඳහා යෙදවූ පසු ඔහුගේ / ඇයගේ පත්වීම් ලිපියෙහි සඳහන් පත්වීම් විෂය හා පත්වීම් මාධ්‍ය අනුව එම පත්වීම් විෂය ප්‍රධාන ඉගැන්වීම් විෂය ලෙස වැඩි කාලච්ඡේද ප්‍රමාණයක් (අවම වශයෙන් මුළු කාලච්ඡේද ප්‍රමාණයෙන් 60%ක්) ඇතුලත් වන කාලසටහනක් ලබා දීමට අදාළ පාසලේ විදුහල්පතිවරයා වග බලා ගත යුතු වන අතර එවැනි කාලච්ඡේද ප්‍රමාණයක් ලබා දීමට නොහැකි වන්නේ නම් ඒ බව අදාළ පත්වීම් බලධාරීන් වෙත නොපමාව දැනුම් දී ඉදිරි පියවර ගැනීමේ වගකීම ද විදුහල්පතිවරයා වෙත පැවරේ.

7.4. එසේම, සියළුම කලාප අධ්‍යාපන කාර්යාලවල විෂයභාර නියෝජ්‍ය/ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් විසින් ද තම විෂයට අදාළව එම අධ්‍යාපන කලාපයට අයත් පාසල් වලට පත්වීම් ලබා ඇති ගුරුවරුන් සඳහා එම පත්වීම් විෂයට අදාළව ප්‍රමාණවත් කාලච්ඡේද ප්‍රමාණයක් සහිත කාලසටහනක් ලබා දී තිබේද යන්න පෞද්ගලිකවම තහවුරු කර ගත යුතු

වන අතර එසේ නොවන අවස්ථාවකදී කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා දැනුවත් කර පත්වීම් බලධාරියා වෙත දැනුම් දී සුදුසු පියවර ගත යුතු වේ.

**7.5.** තව ද, නියමිත පත්වීම් විෂයට පරිබාහිරව වෙනත් විෂයක් ප්‍රධාන ඉගැන්වීම් විෂය ලෙස ඉගැන්වීම් කාර්යයේ නියුතුව සිට පසුකාලීනව සිදුවන ස්ථාන මාරු වීම් සහ වෙනත් සේවාවන් (උදා: ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය/ ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවය) සඳහා පත් කිරීම් ආදී අවස්ථාවන්හි දී ගැටලු මතු විය හැකි බැවින් තම පත්වීම් විෂයට අනුකූලවන කාලසටහනක් ලබා ගැනීමට ගුරුභවතුන්ගේ මෙන්ම ඒ සඳහා අවස්ථාව ලබා දීමට විදුහල්පතිවරුන්ගේද අවධානය යොමු කළ යුතු වේ.

**8.** මෙම චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව පත්වීම් විෂය සංශෝධනය කිරීමෙන් අනතුරුව ජාතික අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතිය (NEMIS) ඊට අනුකූලව යාවත්කාලීන කිරීමට ද සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් විසින් කටයුතු සම්පාදනය කළ යුතු වේ.

**9.** මේ සම්බන්ධයෙන් වැඩිදුර පැහැදිලි කර ගැනීමට අවශ්‍ය වේ නම් ඒ සඳහා පහත සබැඳි ඔස්සේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ගුරු ආයතන) වෙතින් විමසිය හැක.

දුරකථන අංකය - **011 2784819**

ලිපිනය - අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය<br>ඉසුරුපාය, පැලවත්ත, බත්තරමුල්ල

නාලක කලුවැව<br>
ලේකම්<br>
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

උපලේඛන 1

## අධ්‍යාපන චක්‍රලේඛ අංක 07/2019 (i) යටතේ ගුරු පත්වීම් විෂය සංශෝධනය කිරීම

## අයදුම්පත්‍රය

<u>I කොටස</u>

1. ගුරුභවතාගේ සම්පූර්ණ නම :- ................................................................................................

   ................................................................................................................................

2. ජාතික හැඳුනුම්පත් අංකය :- ................................................................................................

3. දැනට සේවය කරනු ලබන පාසල :- ................................................................................................

4. පෞද්ගලික ලිපිනය :- ................................................................................................

   ................................................................................................................................

5. මුල් පත්වීම් දිනය :- ................................................................................................

6. පත්වීම ස්ථිර කර තිබේද? තිබේ නම් පත්වීම ස්ථිර කල දිනය :- ..............................................

7. මුල් පත්වීම් විෂය (පත්වීම් ලිපියේ සඳහන්ව ඇති පරිදි දක්වන්න. පත්වීම් ලිපියේ සහතික කළ පිටපතක් අමුණන්න) :- ................................................................................................

8. පත්වීම් මාධ්‍යය (පත්වීම් ලිපියේ සඳහන්ව ඇති පරිදි) :- ..............................................

9. දැනට උගන්වනු ලබන විෂය/ විෂයයන් (විෂයන් කිහිපයක් උගන්වන්නේ නම් ප්‍රධාන ඉගැන්වීම් විෂය ඉදිරියේ ඒ බව සඳහන් කරන්න) :- ................................................................................................

   ................................................................................................................................

   ................................................................................................................................

10. පත්වීම් විෂය වෙනස් කිරීමට ඉල්ලීම් කරනු ලබන්නේ චක්‍රලේඛයේ 05 ඡේදයේ යටතේ සඳහන් කුමන කාණ්ඩය යටතේද යන්න :- ................................................................................................

    ................................................................................................................................

    ................................................................................................................................

    ................................................................................................................................

11. මුල් පත්වීමේ සිට මේ දක්වා ප්‍රධාන ඉගැන්නුම් විෂයන් පිළිබඳ තොරතුරු (විදුහල්පති විසින් සහතික කරන ලද කාලසටහන් පෞද්ගලික ලිපි ගොනුවේ කාර්ය සාධන වාර්තා මඟින් තහවුරු කල යුතුයි)

| අනු අංකය | පාසල | කාල සීමාව | ප්‍රධාන ඉගැන්නුම් විෂය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

12. පත්වීම් විෂය සංශෝධනය සඳහා ඉල්ලුම් කරන කාණ්ඩය යටතේ එම විෂයට අදාළව සම්පූර්ණ කර ඇති අධ්‍යාපන/ වෘත්තීය සුදුසුකම් (අධ්‍යාපන සහතික හා විස්තරාත්මක ප්‍රතිඵල සටහන් ඇමුණුම් ලෙස ඉදිරිපත් කළ යුතුයි)

| අධ්‍යාපන/ වෘත්තීය සුදුසුකම | ලබාගත් විශ්ව විද්‍යාලය/ ආයතනය | වලංගු වන දිනය | ඇමුණුමට අදාළ අංකය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

13. ඉහත 1 සිට 10 දක්වා මවිසින් සඳහන් කරන ලද තොරතුරු සත්‍ය බව මින් සහතික කරමි. අසත්‍ය හෝ සාවද්‍ය තොරතුරුක් සඳහන් කිරීම විනයානුකූලව දඩුවම් ලැබිය හැකි වරදක් බව දනිමි.

.............................................. ..............................................

ඉල්ලුම්කරුගේ අත්සන දිනය

**II කොටස : විදුහල්පතිගේ තහවුරුව**

**14.** ........................................................................................... යන ගුරුවරයා මෙම විදුහලේ සේවය කරන බවත් ඔහුගේ/ ඇයගේ දැනට ඉගැන්වීම් කරන කාලසටහන් නිවැරදි බවත් ඊට අදාළ සත්‍ය බවට සහතික කළ පිටපත් මේ සමඟ අමුණා ඇති බැවින් ඉගැන්වීම් සිදුකරන ප්‍රධාන ඉගැන්වීම් විෂය ............................................................ හා ඉගැන්වීම් මාධ්‍යය සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි (සුදුසු පරිදි කපාහරින්න) වන බවත් තහවුරු කරමි.

.............................................. දිනය :
........................................

විදුහල්පතිගේ අත්සන

නිලමුද්‍රාව :

---

**III කොටස : කලාප අධ්‍යාපන කාර්යාලයේ විෂය අධ්‍යක්ෂගේ හා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශය**

15. මෙම ගුරුභවතා විසින් ඉහත II කොටසේ දක්වා ඇති ඉගැන්වීම් විෂය හා ප්‍රධාන ඉගැන්වීම් මාධ්‍යය නිවැරදි වේ/ නොවේ.
ඔහුගේ / ඇයගේ එම ප්‍රධාන ඉගැන්වීම් විෂය අනුව පත්වීම් විෂය ................................ ලෙස හා /හෝ පත්වීම් මාධ්‍යය .................................. ලෙස තීරණය කිරීමට / සංශෝධනය කිරීමට නිර්දේශ කරමි/ නොකරමි.

නිර්දේශ නොකරන්නේ නම් හේතු: ...............................................................................
..........................................................................................................................
..........................................................................................................................

.................................... ....................................

විෂය අධ්‍යක්ෂගේ අත්සන දිනය

නිල මුද්‍රාව

මෙම ගුරුභවතා විසින් ඉහත I කොටසේ දක්වා ඇති පෞද්ගලික/ සේවා හා අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳ සඳහන් සියල්ල පෞද්ගලික ලිපි ගොනුව ඇසුරින් පරීක්ෂා කළ බවත් ඒ අනුව එම තොරතුරු නිවැරදි බව තහවුරු කරමි/ නොකරමි. එසේම ඔහුගේ / ඇයගේ මුළු සේවා කාලය තුළ ප්‍රධාන ඉගැන්වීම් විෂය ලෙස දක්වා ඇති තොරතුරු පෞද්ගලික ලිපි ගොනුවේ ඇති තොරතුරු සමඟ සැසඳේ. එම නිසා ඉහත විෂය අධ්‍යක්ෂගේ නිර්දේශය සලකා බලා ඔහු/ ඇය ඉල්ලුම් කරන විෂය ඔහුගේ/ ඇයගේ පත්වීම් විෂය ................................ ලෙස හා /හෝ පත්වීම් මාධ්‍යය ................................. ලෙස තීරණය කිරීමට / සංශෝධනය කිරීමට නිර්දේශ කරමි/ නොකරමි.

16. නිර්දේශ නොකරන්නේ නම් හේතු: ..............................................................................

..............................................................................................................

..............................................................................................................

............................................ ....................................

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ අත්සන දිනය

නිල මුද්‍රාව

IV කොටස: පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් පත් කරනු ලබන පත්වීම් විෂය සංශෝධන පිළිබඳ කමිටුවේ නිර්දේශය

17. මෙම ගුරුභවතා විසින් ඉහත සඳහන් කල තොරතුරු හා සපයා ඇති ඇමුණුම් සියල්ල හොඳින් පරීක්ෂා කර තහවුරු කර ගත් බවත්, අධ්‍යාපන චක්‍රලේඛ 07/2019(i) හි සඳහන් අදාළ කාණ්ඩයට නියමිත සුදුසුකම් සම්පූර්ණ කර ඇති බවත්, තහවුරු කරමු.

ඒ අනුව, අධ්‍යාපන චක්‍රලේඛ 07/2019(i) හි විධිවිධාන ඔහුගේ / ඇයගේ පත්වීම් විෂය ................................ ලෙස හා /හෝ පත්වීම් මාධ්‍යය ................................. ලෙස තීරණය කිරීමට / සංශෝධනය කිරීමට නිර්දේශ කරමු/ නොකරමු.

නිර්දේශ නොකරන්නේ නම් හේතු: ..............................................................................

..............................................................................................................

..............................................................................................................

කමිටු සාමාජිකයන්ගේ අත්සන සමඟ නිලමුද්‍රාව

| අනු අංකය | නම / තනතුර | අත්සන | නිල මුද්‍රාව |
|---|---|---|---|
| 01 | | | |
| 02 | | | |
| 03 | | | |
| 04 | | | |
| 05 | | | |

දිනය : ..........................................................

---

**V කොටස : පත්වීම් බලධාරියා විසින් අනුමත කිරීම**

18. ඉහත IV කොටස යටතේ දක්වා ඇති නිර්දේශය අනුව මෙම ගුරුභවතාගේ

**පත්වීම් විෂය: ......................................................................**

**පත්වීම් මාධ්‍යය :...................................................................**

**ලෙස මෙදින සිට තීරණය කිරීමට / සංශෝධනය කිරීමට අනුමත කරමි/ නොකරමි.**

......................................................... ..........................................

**පත්වීම් බලධාරියාගේ අත්සන** **දිනය**

උපලේඛන II

විදුහල්පති මඟින්,

<ගුරුභවතාගේ නම>

<වර්තමාන සේවා ස්ථානය>

<u>අධ්‍යාපන චක්‍රලේඛ 07/2019(i) යටතේ ගුරු පත්වීම් විෂය තීරණය කිරීම</u>

<මුල් පත්වීම් ලිපිය නිකුත් කර ඇති බලධාරියා> විසින් <මුල් පත්වීම් ලිපියෙහි සඳහන් කර ඇති පරිදි උදා:- බස්නාහිර පළාත් ගුරු/ ශ්‍රී ලංකා ගුරු > සේවයට පත් කරමින් ඔබ වෙත නිකුත් කර ඇති අංක ........................................................ හා ............................................ දිනැති පත්වීම් ලිපියේ පත්වීම් විෂය හා පත්වීම් ලිපියේ පත්වීම් මාධ්‍යය <පත්වීම් මාධ්‍යය හෝ පත්වීම් විෂය යන දෙකෙන් එකක් පමණක් නම් අදාළ කොටස පමණක් ඇතුලත් කරන්න> නිශ්චිතව සඳහන් නොවන බැවින් <පත්වීම් විෂය සංශෝධනය අනුමත කළ දිනය > ...................................................................... දින සිට ඔබගේ පත්වීම් විෂය හා මාධ්‍යය පහත පරිදි විය යුතු බවට තීරණය කරමි.

පත්වීම් විෂය :.....................................................................

පත්වීම් මාධ්‍යය :..................................................................

02. ඔබගේ ඉහත සඳහන් පත්වීම් ලිපියේ අනෙකුත් කොන්දේසි ඒ අයුරින්ම තවදුරටත් බලපැවැත්වේ.

<පත්වීම් බලධාරියාගේ නම>

<තනතුර>

පිටපත්:

1. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ,................................ පළාත - කරු.ඔබගේ අංක ....................... හා ...................දිනැති ලිපිය අනුව කරු.දැ.ගැ.ස.
2. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ, ........................................ - කරු.අ.ක.ස.
3. විදුහල්පති, ........................................................... - කරු.අ.ක.ස.
4. පෞද්ගලික ලිපි ගොනුවට

උපලේඛන III

දිනය: ................................................

විදුහල්පති මඟින්,

<ගුරුභවතාගේ නම>

<වර්තමාන සේවා ස්ථානය>

අධ්‍යාපන චක්‍රලේඛ 07/2019(i) යටතේ ගුරු පත්වීම් විෂය සංශෝධනය කිරීම

<මුල් පත්වීම් ලිපිය නිකුත් කර ඇති බලධාරියා> විසින් <මුල් පත්වීම් ලිපියෙහි සඳහන් කර ඇති පරිදි උදා:- බස්නාහිර පළාත් ගුරු/ ශ්‍රී ලංකා ගුරු > සේවයට පත් කරමින් ඔබ වෙත නිකුත් කර ඇති අංක ........................................................ හා ............................................ දිනැති පත්වීම් ලිපියේ සඳහන් පත්වීම් විෂය/ මාධ්‍යය, <පත්වීම් විෂය සංශෝධනය අනුමත කළ දිනය සඳහන් කරන්න> ........................................................................................ දින සිට පහත පරිදි සංශෝධනය කරමි.

නව පත්වීම් විෂය: ...................................................................

නව පත්වීම් මාධ්‍යය: ..............................................................

<සංශෝධනය කරනුයේ පත්වීම් විෂය හෝ මාධ්‍යය යන දෙකෙන් එකක් පමණක් නම් අදාළ කොටස පමණක් සඳහන් කරන්න>

02. ඔබගේ ඉහත සඳහන් පත්වීම් ලිපියේ අනෙකුත් කොන්දේසි ඒ අයුරින්ම තවදුරටත් බලපැවැත්වේ.

<පත්වීම් බලධාරියාගේ නම>

<තනතුර>

පිටපත්:

1. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ,............................... පළාත - කරු.ඔබගේ අංක ....................... හා ...................දිනැති ලිපිය අනුව කරු.දැ.ගැ.ස.
2. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ, ...................................... - කරු.අ.ක.ස.
3. විදුහල්පති, ......................................................... - කරු.අ.ක.ස.
4. පෞද්ගලික ලිපි ගොනුවට